# ප්‍රවෘත්ති නිවේදනය

## නිෂ්පාදකයාගේ මිල දර්ශකය (පදනම: 2013 සිව්වන කාර්තුව = 100)

## 2016 පළමු කාර්තුව

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අළුතින් හඳුන්වාදෙන ලද නිෂ්පාදකයාගේ මිල දර්ශකය 2015 දෙවන කාර්තුවේ සිට අදාළ කාර්තුව අවසන් වී සති 5කට පසු ප්‍රකාශයට පත් කරනු ලැබේ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් මෙම දර්ශකය හඳුන්වාදීමත් සමඟ, නිෂ්පාදකයාගේ මිල හා පාරිභෝගිකයාගේ මිල දක්වා ආර්ථිකයේ මිල සංඛ්‍යාති ව්‍යුහය පිළිබඳ සම්පූර්ණ ආවරණයක් සිදුකරයි.

සියළුම ආර්ථික කටයුතු (කෘෂිකර්ම, නිෂ්පාදන කර්මාන්ත, විදුලිය හා ජලය) සඳහා නිෂ්පාදකයාගේ මිල දර්ශකයේ අගයන් 2016 ජනවාරි, පෙබරවාරි සහ මාර්තු යන මාසවල පිළිවෙලින් 103.8, 103.0 හා 101.3 වේ. පසුගිය වර්ෂයේ අදාළ මාස සමඟ සන්සන්දනයේ දී සමස්ත දර්ශකය ජනවාරි මාසයේ 3.2% ක ද, පෙබරවාරි මාසයේ 0.2% ක ද, මාර්තු මාසයේ 0.6% ක ද අඩුවීමක් පෙන්නුම් කරයි. පසුගිය වර්ෂයේ පළමු කාර්තුවේ අදාළ මාස සමඟ සන්සන්දනයේ දී 2016 පළමු කාර්තුවේ සියළු මාසවල කෘෂිකාර්මික අංශයේ මිල දර්ශකයන්ගේ අඩුවීමක් වාර්තා වී ඇත. එසේ වුවත් නිෂ්පාදන සහ විදුලිය හා ජල සැපයුම් අංශය සඳහා වන දර්ශකයන්හි වැඩිවීමක් එම මාසවල වාර්තා වී ඇත.

2016 පළමු කාර්තුව සඳහා, අනුයාත මාස 2ක් අතර සැසඳීමේදී සියළුම අයිතමයන්ගේ දර්ශකයේ අඛණ්ඩ අඩුවීමක් සිදු වී ඇත. ප්‍රධාන ආර්ථික කටයුතු වෙන්වෙන් වශයෙන් සළකා බැලූවිට, කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදකයාගේ මිල දර්ශකයන්හි නිරන්තර පහත වැටීමක් වාර්තා වී ඇත.

දේශිය නිෂ්පාදකයන්ට තමන් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ හා සේවා සඳහා ලැබෙන සාමාන්‍ය මිල ගණන්වල කාලයත් සමඟ සිදුවන වෙනස්වීම නිෂ්පාදකයාගේ මිල දර්ශකය මගින් මනිනු ලබයි. නිෂ්පාදකයාගේ මිල දර්ශකය හඳුන්වාදීම තුළින් වෙළඳපොල මිල ගණන්වල සිදුවන විචලනයන් වඩා නිවැරදි ව පෙන්නුම් කරන අතර එම ප්‍රවණතා උපයෝගී කර ගනිමින් වඩාත් නිවැරදි තීරණ ගැනිමට හැකියාව ලැබේ.

තව ද, මෙය වැදගත් සාර්ව ආර්ථික දර්ශකයක් වේ. මෙය කෙටි කාලීනව ඇතිවිය හැකි උද්ධමන ප්‍රවණතා දර්ශකයක් හා ආර්ථික දත්ත කාණ්ඩයන්හි අවධමනයක් ලෙස ද කටයුතු කරයි. මෙම දර්ශකය ඵලදායිතා විශ්ලේෂණයට මෙන් ම කොන්ත්‍රාත් ගිවිසුම් සඳහා අගය තීරණය කිරිමට, ව්‍යාපාර තොරතුරු විශ්ලේෂණය හා ස්ථාවර වත්කම්වල වර්තමානයේ පවතින මිල ගණනය කිරීම් සඳහා ද භාවිතා කරයි.

ආචාර්ය අමර සතරසිංහ
අධ්‍යක්‍ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
දුරකථන අංක: 011-2147001 / 011-2147020